## ඡන්දයක් ඉවරයි

ඔස්ට්‍රේලියාවෙ ඡන්දය ඉවරයි. ප්‍රතිඵල තාම නැහැ. චූටි මල්ලිත් ඉවසිල්ලක් නැතුව බලාගෙන ඉන්නෙ මොකද වෙන්නෙ කියලා. චන්දෙ දවසෙ රෑ ලංකාවෙ වගේම තමයි.කට්ටිය සෙට් වෙලා ප්‍රතිඵල ඇහුවා. හැබැයි අර චන්ද ගෝ එක මෙහේ නැහැ. අධ්‍යාපනය රැකෙයිද? ප්‍රතිපාදන අඩුවෙයිද? මෙඩිකෙයා එක නැතිවෙයිද? ඒක රැකෙයිද? සෞඛ්‍යයට ප්‍රතිපාදන අඩුවෙයිද? මේවා තමයි ප්‍රශ්න වෙලා තියෙන්නෙ රටේ ආර්ථිකය ශක්තිමත් කරනවට වඩා. ලේබර් පක්ෂයේ නැගීම අපට විග්‍රහ කරන්න වෙලා තියෙන්න ඒ විදිහට.



මට නම් ඕව ප්‍රශ්න නෙවෙයි. ඒක ලෝකල් නෙවෙයි ඉන්ටනැෂනල්. ලෝකය පුරා මතුවමින් පවතින එක් වී ජීවත් වනවාට වඩා ජාති ආගම් වශයෙන් බෙදි වෙන්වී යාමේ ප්‍රවණතාව ඔස්ට්‍රේලියාවටත් නැවතත් කාන්දුවෙමින් තිබෙන බව පෙනී යාමයි මගේ හිත සසළ කළේ.

ජනතාව ප්‍රතික්ෂෙප කිරීමෙන් පසුව දීර්ඝ කාලයක් නිහඬව සිටි ජාතිවාදී බලවේග මෙවර මැතිවරණයෙන් ඉදිරියට පැමිණ සිටිනවා. නැවත වතාවක් ජාතිවාදයේ බීජ මේ රටේ ඉස්මතුවෙයිද කියන සැකය දැන් දැන් මතුවෙනවා. ඔවුන්ට සෙනෙට් අසුන් කීපයක් හිමිවී තිබීම බොහෝ අය ගණන් නොගෙන සිටියත් ඔවුන්ගේ කියුම් කෙරුම් සමාජ සහජීවනයට එරෙහිව කරන බලපෑම සුළුපටු නැහැ. නිකමට හරි මේ මැතිවරණයට පෙර ඕස්ට්‍රේලියාවෙ බෝම්බයක් පුපුරා ගියා නම් ඔවුන් ගන්නා ඡන්ද ප්‍රමාණය අපට හිතාගන්නවත් බැරි තරමට වැඩිවෙන බව නම් සැකයක් නැහැ. එය සමහර විට රට තුළ දරුණු බෙදීමක් ඇති වන්නටත් හේතු වන්නට ඉඩ තිබුණා. මං කියන දේ හිතලුවක් වගේ පෙනී ගියත් ලෝකය දැන් වේගයෙන් ඇදී යමින් තිබෙන්නෙ ඒ දිහාවට. මේක අපේ අවධානයට දැඩි ලෙස ලක්විය යුතු කාරණයක්.

අනෙක් කාරණය ජනතාව ප්‍රධාන පක්ෂ කෙරෙහි ඇති තමන්ගේ අප්‍රසාදය ප්‍රදර්ශනය කර තිබෙන්නෙ ස්වාධීනව ඉල්ලූ අයට වැඩියෙන් ඡන්දය දීමෙන්. ඔවුන් බලවත් කිරීමෙන්. ඒ හරහා පොදු ජන ප්‍රශ්න කෙරෙහි රජයේ අවධානය යොමුකරවා ගැනීමට ජනතාව බලාපොරොත්තු වන බවක් පේනවා.

ලංකාවෙත් කොලයි නිලුයි රතුයි. මෙහෙත් කොලයි නිලුයි රතුයි. නියමයි නේද?

## සෝමවංශ සහෝදරයා ගැන



සමුගත් සෝමවංශ අමරසිංහ සහෝදරයා ගැන යමක් ලිවිය යුතුයි කියලා හිතුණෝ මෑත කාලය තුළ චූටි මල්ලිගේ හිතට අවංකව දුකක් ඇති කර වෙන්ව ගිය පුද්ගලයකු ලෙස දැනෙන නිසයි. ඒ දුක ඇති වුණේ ඔහු පොදු අරගලය සමග සෑහන කාලයක් සිටි නිසාම නෙවෙයි. මිනිසකු තනි වූ විට ක්‍රියා කරන ආකාරය පිළිබඳව හැබෑම උදාහරණයක් සැපයූ පුද්ගලයකු ලෙස මට ඔහු පෙනන නිසයි. ඔහු පිළිබඳව බොහෝ සත්‍ය දේ දැන සිටියත් ඒවා මෙතැනට අදාල වෙන්නෙ නැහැ. එහෙත් කෙනකු ධනපති පක්ෂක හෝ විප්ලවවාදී පක්ෂයක හෝ සිටියත් තමන්ට හිමිව තිබූ යමක් අහිමි වූ විට එය උපෙක්ෂාවෙන් විඳ දරා ගැනීමට ඇති නොහැකියාව නිසා අසාමාන්‍ය ලෙස ඉවක් බවක් නැතුව ක්‍රියා කරන ආකාරය පිළිබඳව උදාහරණ මෑත කාලයේ අපමණව තිබුණත් සුවිශේෂී පුද්ගල ප්‍රතිරූපයක් ගොඩ නගා ගෙන සිටි අමරසිංහ සහෝදරයා අවසන් කාලයේ කෙරූ විගඩම් නිසා සමාජයේ උපහා සයට ලක්වීම කණගාටුවට කාරණයක්. එනිසාම තමයි



මම හැමවිටම අදහස් කරන්නේ නායකයකු යනු ජනතාවට කන්දෙමින් ඔවුන් හා එකට යන්නකු නොව තමන්ගේ බසට ජනතාවට කන් දෙන්නට සලස්වමින් ජනතාවට තමන්ගේ පසුපසින් ඒමට සළස්වන්නකු බවයි. ඇත්තටම නායකයකු ලෙස ඔහු වටා ගොඩ නැගී තිබුණු රශ්මි කදම්බය බිඳ වැටුණේ ඔහු පක්ෂයෙන් ඉවත් වූ නිසා නොව තනි පුද්ගලයකු ලෙස ප්‍රශ්න වලදී ඔහු කළ ක්‍රියාකාරකම් නිසා බව පැහැදිළියි. ඔහු මිය ගිය දවසේ පොඩි අයියා බොහෝ වේලාවක් කතා කරමින් සිටියේ ශෝකයකට වඩා අනුකම්පාවකින්. ඔහුගේ අවසන් කාලය තුළ කළ ක්‍රියාකාරකම් අයියලාට බොහෝ ප්‍රශ්න මතු කළත් ඔවුන් ඊට එරෙහිව නොගියේ කෙ?තුක වස්තුවකට දක්වන සැළකීම එවුන්ගේ සිත් තුළ ඔහු කෙරෙහි තිබූ නිසා බව මම හොඳින් දන්නා සත්‍යයක්. ඔහු ගත් තීරණ කළ කී දෑ සියල්ල පසෙක ලා ජීවිත කාලයෙන් හතරෙන් තුනක් පමණ තමන් විශ්වාස කළ දෙය වෙනුවෙන් පෙනී සිටීම අගය කළ යුතුයි. එහිදී ඔහුගේ නායකත්වය නොව මැදිහත්වීම වඩා වැදගත් බව මම පිලිගන්නවා. කණගාටුවක් ඇති වන්නේ සිය ජීවිත කාලයෙන් වැඩි කොටසක් තමන් ඇදහූ දර්ශනය වෙනුවෙන් ගොඩ නැගූ පක්ෂයට වැය කරමින් දශක දෙකක කාලයක් එම පක්ෂයේ නායකයකු ලෙසද සිටි ඔහුගේ වියෝව සමාජයට කිසිදු බලපෑමක් නොකොට තවත් එක් මරණයක් පමණක් ලෙස සමාජයට දැනීමයි. මිනි සුන් කරුමය කියා කියන්නේ මෙයට විය යුතුයි.




NEXUS CARGO
SHIPPING SCHEDULE - 2016
SYDNEY to COLOMBO & NINTAVUR

| MONTH | CUT OFF DATE | ESTIMATED DATE OF COLLECTION |
|---|---|---|
| APRIL | 16.04.2016 | 23.05.2016 |
| MAY | 21.05.2016 | 27.06.2016 |
| JUNE | 18.06.2016 | 25.07.2016 |
| JULY | 16.07.2016 | 22.08.2016 |
| AUGUST | 13.08.2016 | 19.09.2016 |
| SEPTEMBER | 10.09.2016 | 17.10.2016 |
| OCTOBER | 15.10.2016 | 21.11.2016 |
| NOVEMBER (1) | 05.11.2016 | 12.12.2016 |
| NOVEMBER (2) | 12.11.2016 | 19.12.2016 |
| NOVEMBER (3) | 19.11.2016 | 02.01.2016 |
| DECEMBER | 10.12.2016 | 23.01.2017 |




**Astrological Services**
By Ramya Attygalla
(over 20 years' experience)

Casting of Horoscope (Dala Kendera and/or Bawa Kendera)
Reading of Horoscope (Palapala)
Nekath for all occassions
Matching for compatibility (Porondam)
We do not use any software;
all work is carried out by traditional methods.

**Readings will be sent via email, but please call if you require further details.**

Email: ramyaattygalla@gmail.com
Mobile Phone Numbers: 00 11 94 7117 90367
or 00 11 94 1127 00481

Local Inquiries: Chandini on 0422 31 2110 or 03 9798 6140

**Very reasonable charges.**
**Payments to a CBA Bank Account or via PayPal.**